සැකසුම -වයි.එම්.ශ්‍රියානි පෙරේරා
ර/තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

## කාර්ය පත්‍රිකාව - 04 වන සතිය

- **නිපුණතාව 05** - **ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි**
- **නිපුණතා මට්ටම 5.2** - **නර්තනය හා සබැඳි ගායන ඉදිරිපත් කරයි**
- **පාඩම** - **නර්තනයට පෙර ගයමු**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) උඩරට නර්තන සම්ප්‍රදායේ එන තාල රූප දෙකක් ඇතුළත් වන්නමකි

(i) ගජගා වන්නම
(ii) මුසලඩි වන්නම
(iii) සිංහරාජ වන්නම
(iv) උරගා වන්නම

(02) උඩරට මයුරා වන්නමේ තාල රූපය වන්නේ

(i) මාත්‍රා 2+2+4 තුන් තිතයි
(ii) මාත්‍රා 2+2+3 තුන් තිතයි
(iii) මාත්‍රා 3+4 දෙතිතයි
(iv) මාත්‍රා 2+2+2+4 සිව් තිතයි

(03) මුසලඩි වන්නමේ ඇතුලත් බෙර පදයකි

(i) දොං දොං ජිං ජිං ගජිගත
(ii) දොං දොං ජිං ජිං තකට දොං තක
(iii) දොං ජිංත ගත දොංත
(iv) දොදොංත තකු දොම්

(04) ''පතර තෙද ගාම්භීර සතට සෙත වේල අවිය දරා'' මෙම පදය ඇතුලත් වන්නේ

(i) ගජගා වන්නමේ ය
(ii) සැවුලා වන්නමේ ය
(iii) සුරපති වන්නමේ ය
(iv) මයුරා වන්නමේ ය

(05) පිළිවෙළින් උඩරට පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්හි මාත්‍රා 3 තනි තිතේ තාලයට නර්තනය කරනු ලබන්නේ

(i) මයුරා වන්නම, ලලිතරාග තාලය සින්දු වන්නම, නාග ගජගා වන්නම
(ii) ගණපති වන්නම, ලලිතරාග තාලය සින්දු වන්නම, තිසරා වන්නම
(iii) කොවුලා වන්නම, මුසලඩි වන්නම, ශුද්ධ තාලය සින්දු වන්නම
(iv) ගණපති වන්නම, ශුද්ධ තාලය සින්දු වන්නම, තිසරා වන්නම

**හිස්තැන් පුරවන්න**

(i) පහතරට නර්තන සම්ප්‍රදායේ මාත්‍රා 2+2+3 තුන් තිත තාලයට ................................................................................ සින්දු වන්නම නර්තනය කරයි.

(ii) තෙහිං තකු තෙහිං තකු ................................................................................ යනු ................................................................ වන්නමේ බෙර පදය යි.

(iii) ගත් නැණින් යුතු සුරිඳෙක් බැවින් ඉසි දැන යනු ...................................................................................... අයත් පද කොටසකි.

(iv) මුසලඩි වන්නමෙහි ඇතුලත් තාල රූප ලෙස ........................................................................... සහ ............................................................ දැක්වේ

(v) මාත්‍රා 3+4 දෙතිත තාලෙට පහතරට ................................................................................ සින්දු වන්නම නර්තනයේ යෙදේ.

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) ඔබ උගත් වන්නම් ගායනය කරන්න.

(02) උගත් ගායනා වලට අදාල පසුබිම් විස්තර කරන්න.

(03) මෙම කවි ගායන සංරක්ෂණය සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.